රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 350

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ – 7.
1986 නොවැම්බර් මස 12 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීම – 1986.10.08 දිනැති අංක: 346 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන.**

1986.10.08 දිනැති අංක: 346 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි කරුණාකර සංශෝධනය කරන්න.

2. 03 (අ) ඡේදයේ අවසාන වාක්‍යය ඉවත් කර මෙය ආදේශ කරන්න.

" තුවාලය පහත දැක්වෙන පරිදි වන්දි සඳහා වර්ග කිරීම, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ කොළඹ (ශික්ෂණ) මහ රෝහල, අධ්‍යක්ෂ හෝ පත් කරන වෛද්‍ය මණ්ඩලය කරනු ඇත. "

3. 04 (අ) (II) ඡේදය ඉවත් කර මෙය ආදේශ කරන්න.

" ඔහු වෛද්‍ය මණ්ඩලයක් පත් කරන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් හෝ කොළඹ (ශික්ෂණ) මහ රෝහල, අධ්‍යක්ෂ වෙතින් හෝ වහාම ඉල්ලීමක් කළ යුතුය. "

4. 04 (ආ) ඡේදය ඉවත් කර මෙය ආදේශ කරන්න.

" සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හා වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් අමාත්‍යාංශයේ ලේකම් මෙම විධිවිධාන සඳහා අවශ්‍ය උපදෙස් සියළුම අදාළ බලධාරීන්ට දැන්විය යුතුය. "

Siriwardhana

(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.